ජාතික විගණන කාර්යාලය

தேசிய கணக்காய்வு அலுவலகம்

NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. SGLG/RT/A/KOPS/FA/A$_3$/05/2023/07

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2024 අප්‍රේල් 26 දින.

ලේකම්,

කොලොන්නා ප්‍රාදේශීය සභාව.

කොලොන්නා ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(I) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

කොලොන්නා ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කොලොන්නා ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව සභාව සතු මෝටර් රථවල වටිනාකම රු.29,194,537ක් වුවද, 2020 වර්ෂයේ සිදුකරන ලද තක්සේරුව අනුව එම වටිනාකම රු.20,985,000ක් වූයෙන්, ජංගම නොවන වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායක වීමේ ගිණුමේ ශේෂය රු.8,209,537ක් වැඩියෙන් දැක්වුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී වෙන්දේසි කරන ලද වාහන 02ක වටිනාකම ගිණුම්වලින් ඉවත් නොකිරීම නිසා ජංගම නොවන වත්කම් සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායක වීමේ ගිණුමේ ශේෂය රු.315,000ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී කොලොන්න සතිපොළ ගොඩනැගිල්ලේ වැසිකිළි සකස් කිරීම සඳහා වැයකළ රු.430,893ක් ප්‍රාග්ධනීත කර නොතිබීම නිසා ජංගම නොවන වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායක වීමේ ගිණුම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී මිලදීගත් හා පරිත්‍යාග ලෙස ලැබුණු වටිනාකම රු.492,672ක යන්ත්‍ර උපකරණ හා ලී බඩු සවිකිරීම් ප්‍රාග්ධනීත කර නොතිබුණි. එම නිසා ජංගම නොවන වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායක වීමේ ගිණුම රු.492,672ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී මිලදීගත් හා පරිත්‍යාග ලෙස ලැබුණු වටිනාකම රු.249,581ක පුස්තකාල පොත් ගිණුම්ගත කර නොතිබුණි. එම නිසා පුස්තකාල පොත් සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායක වීමේ ගිණුම එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ සේවක ණය පොලී ආදායම් රු.206,825ක් සදොස් ලෙස සේවක ණය ගිණුම බැර කර තිබුණි. එම නිසා ජංගම වත්කම් හා වර්ෂයේ අතිරික්තය රු.206,825ක් අඩුවෙන් දැක්වුණි.

(උ) සමාලෝචිත වර්ෂයට අදාළ ස්ථාවර තැන්පත් පොලී රු.234,002ක් පොලී ආදායම් ගිණුම බැර කරනු වෙනුවට සදොස් ලෙස ලැබිය යුතු තැන්පත් පොලී ගිණුමට බැර කර තිබුණි. එම නිසා ජංගම වගකීම් රු.234,002ක් වැඩියෙන් හා වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය රු.234,002ක් අඩුවෙන් දැක්වුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය සඳහා හිඟහිටි ප්‍රාග්ධන ආධාර ශේෂය රු.5,863,750ක් වුවද, ජර්නල් සටහන් 14 මගින් එය රු.16,445,012ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. එම නිසා ජංගම වත්කම් හා ප්‍රාග්ධන ආදායම් රු.10,581,262ක් වැඩියෙන් දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉකුත් වර්ෂයන්ට අදාළ කර්මාන්ත ණයගැතියෝ රු.25,633,709ක් වැඩියෙන් දක්වා තිබුණි. එම නිසා ජංගම වත්කම් හා සමුච්චිත අරමුදල එම වටිනාකමින් වැඩියෙන් දැක්වුණි.

(ඒ) ඉකුත් වර්ෂයන්ට අදාළ කර්මාන්ත 06ක ණයහිමි ශේෂය තුළ ඇතුළත් කර්මාන්ත 04ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට ද ඉටු කර නොතිබුණි. එම නිසා කර්මාන්ත ණයහිමියෝ රු.11,999,032ක් වැඩියෙන් හා සමුච්චිත අරමුදල සමාන වටිනාකමින් අඩුවෙන් දැක්වුණි.

(ඔ) ඉකුත් වර්ෂයට අදාළ හිඟ සම්ප්‍රේෂණ කුළුණු ආදායම රු.12,000ක් සහ හිඟ දැන්වීම් පුවරු ගාස්තු රු.58,850ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය රු.70,650ක් වැඩියෙන් දැක්වුණි.

(ඔ) 2022 වර්ෂයේ විගණකාධිපති වාර්තාව මගින් පෙන්වා දී තිබුණු පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් ද නිවැරදි කර නොතිබුණි.

(i) ප්‍රාදේශීය සභාවේ නව කොම්පෝස්ට් අංගනය ඉදිකිරීමේ පිරිවැය රු.5,426,213ක් වුවද, එය රු.6,000,000ක් ලෙස ප්‍රාග්ධනීත කර තිබීමෙන් ජංගම නොවන වත්කම් සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායක වීමේ ගිණුම රු.573,787ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ii) 2014 වර්ෂයේ ඉදිකරන ලද වාහන නැවැත්වීමේ අංගනයේ වටිනාකම ප්‍රාග්ධනීත කර නොතිබීම නිසා ජංගම නොවන වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායක වීමේ ගිණුම රු.128,032ක් අඩුවෙන් දැක්වුණි.

(iii) වටිනාකම රු.1,018,455ක යන්ත්‍ර උපකරණ හා රු.18,000ක ලී බඩු හා සවිකිරීම ප්‍රාග්ධනීත කර නොතිබීම නිසා ජංගම නොවන වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායක වීමේ ගිණුම රු.1,036,455ක් අඩුවෙන් දැක්වුණි.

(iv) සභා අරමුදලින් කම්කරු දෛනික වැටුප් ගෙවීම ලැබිය යුතු වැටුප් හා මන්ත්‍රී දීමනා ලෙස ගිණුම්ගත කර තිබීම නිසා ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ ගිණුම රු.110,525ක් වැඩියෙන් දැක්වුණි.

(ක) ගිණුම් විෂයයන් 05කට අදාළව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.1,066,883ක වෙනසක් විය.

(ග) ගිණුම් විෂයයන් 02කට අදාළව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.26,420ක වෙනසක් විය.

(ච) සමාලෝචිත වර්ෂය අවසානයට රු.48,222,679ක් වූ හිඟහිට් ප්‍රාග්ධන ආධාර ශේෂයට අදාළ විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

CamScanner

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූෂසන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (ඕ) ඡේදයේ (i), (ii), (iii), (iv) නිරීක්ෂණයන් හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371 (5)	1998 වර්ෂයේදී ලබාදී තිබුණු රු.33,000ක අත්තිකාරමක් පියවා නොතිබුණි.
(ආ)	2017 ජූලි 25 දිනැති අංක 02/2017 දරන ජාතික අයවැය චක්‍රලේඛය	නිමවුම් දර්ශක හා ප්‍රධාන කාර්යසාධන දර්ශක හඳුනාගෙන නොතිබුණි.

CS CamScanner

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.5,517,080ක් වූ අතර, ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.7,947,409ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	2023				2022			
ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තුගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තුගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
වරිපනම් හා බදු	825,300	1,265,384	1,326,984	299,419	753,700	1,055365	1,118,915	360,729
කුලී	5,920,568	3,972,898	4,103,143	276,034	5,165,914	3,624,433	3,494,522	2,443,126
බලපත්‍ර ගාස්තු	5,704,200	3,560,234	3,560,234	-	1,115,500	973,580	973,580	-
වෙනත් ආදායම්	7,746,542	8,398,301	8,398,301	-	3,316,542	3,316,542	1,046,258	-
	20,196,610	17,196,817	17,388,662	575,453	10,351,656	8,969,920	6,633,275	2,803,855

සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ ආදායම රු.2,803,855ක් වූ අතර, වර්ෂයේ බිල්කිරීම රු.17,196,817ක් විය. ඒ අනුව වර්ෂය තුළ රැස්කළ යුතු සමස්ථ ආදායම රු.20,000,672ක් වුවද, රැස් කරන ලද ආදායම රු.17,388,662ක් වීමෙන් තවදුරටත් රැස්කර ගතයුතු සමස්ථ ආදායම ප්‍රතිශතයක් ලෙස සියයට 13ක මට්ටමක පැවැතිණි.

CamScanner

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කළ ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් හා බදු, බලපත්‍ර ගාස්තු සහ වෙනත් ආදායම් යන ආදායම් විෂයයන්ගෙන් රැස්කළ ආදායම අපේක්ෂිත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 61කින්, 12කින් හා 13කින් වැඩි වී තිබුණු අතර, බදු කුලී ආදායම්, සේවා සඳහා ගාස්තු, වරෙන්තු හා දඩ සහ රජයේ දායකත්වය යන ආදායම් විෂයයන්ගේ රැස්කළ ආදායම අපේක්ෂිත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 31කින්, 44කින්, 95කින් හා 19කින් අඩු වී තිබුණි.

2.2.3 වරිපනම් හා බදු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සංවර්ධිත ප්‍රදේශ ලෙස 2020 වර්ෂයේදී ගැසට් කරන ලද ප්‍රදේශවලින් වරිපනම් බදු අයකිරීමට 2023 දෙසැම්බර් වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව සතු සිම්බදු ඒකක 29ක් 1983 වර්ෂයේ සිට නිර්ණුමිත විධිමත් නොකර ලබා දී තිබුණි. 2010 වර්ෂයෙන් පසුව එම දේපළවල තක්සේරු ගාස්තු ප්‍රතිශෝධනය කිරීමට ද කටයුතු කර නොතිබුණි.

2.2.4 වෙනත් ආදායම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2021 වර්ෂයේ ඉදිකර තිබුණු සම්ප්‍රේෂණ කුළුණු 04ක් හා ගොඩනැගිලි අනුමැතිපත්‍ර සඳහා පෙරසැරි ගාස්තු රු.76,259ක් අඩුවෙන් අයකර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන වනවිට අයවිය යුතු තීරු ජල ගාස්තු රු.99,863ක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

2.2.5 උසාවි දඩ

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.3,126,350ක් විය.

CamScanner

2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

කොළොන්නාව ජල ව්‍යාපෘතිය සඳහා කොළොන්නාව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය විසින් 2023 අගෝස්තු 25 දින ලබා දී තිබුණු ජල තත්ත්ව වාර්තාව අනුව එම ජලය බීමට සුදුසු නොවන බව දක්වා තිබුණි. එමෙන්ම, අදාළ ජල සැපයුම් විධිමත් ලෙස විෂබීජහරණය කිරීමට වහාම කටයුතු කරන ලෙසත්, ජලය රත් කරනු ලබන [illegible] ගැනීමට කටයුතු කරන ලෙසත්, උපදෙස් දී තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. [illegible] ව්‍යාපෘතිය සඳහා 2017 පෙබරවාරි 20 දිනෙන් පසුව ජල තත්ත්ව පරීක්ෂණයක් සිදුකර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුව විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) පොදු උපයෝගිතා සේවා

2023 වර්ෂයේ කාර්යය සාධන වාර්තාව අනුව සභා බල ප්‍රදේශයේ ජලනල පහසුකම් වැඩිදියුණු කිරීම, වැසි ජල කාණු නඩත්තුව හා අලුත්වැඩියාව මෙන්ම ජල පහසුකම් අවම ප්‍රදේශ සඳහා එම පහසුකම් සැපයීම යන කාර්යයන් ඉටුකිරීමේ ප්‍රගතිය දුර්වල මට්ටමක පැවැතිණි.

(ආ) අතුරු ව්‍යවස්ථා

(i) මහජන පුස්තකාලය විධිමත් කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 05 වගන්තිය ප්‍රකාරව මහජන පුස්තකාලයේ අධීක්ෂණය හා සාමාන්‍ය පරිපාලනය සඳහා වාර්ෂිකව පත්කළ යුතු පුස්තකාල උපදේශන කමිටුව මේ දක්වා පත්කර නොතිබුණි.

(ii) සභාවේ ලියාපදිංචි වන ත්‍රීරෝද රථයකින් රු.600 බැගින් ත්‍රීරෝද රථ 82කින් රු.49,200ක් සමාලෝචිත වර්ෂය තුළ අයකර තිබුණද, ත්‍රීරෝද රථ නියාමනය හා ගාස්තු අයකිරීම සඳහා අතුරු ව්‍යවස්ථාවන් පනවාගෙන නොතිබුණි.

(ඇ) **කසළ කළමනාකරණය**

සභාව විසින් දෛනිකව එක් කරන දිරන කසළ ප්‍රමාණය දළ වශයෙන් කිලෝග්‍රෑම් 180ක් පමණව තිබියදී, රු.1,575,000ක් වැයකර කිලෝග්‍රෑම් 6,000ක ධාරිතාවයෙන් යුතු පොහොර යන්ත්‍රයක් 2021 දෙසැම්බර් මස මිලදී ගෙන තිබුණි. යන්ත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් කසළ සොයා එක් නොවීම හේතුවෙන් 2023 ජනවාරි මාසයේ වන විට එක් වතාවක් පමණක් එය ක්‍රියාත්මක කර තිබුණි. එමෙන්ම,රු.570,000ක් වැයකර මිලදී ගෙන තිබුණු විපර් යන්ත්‍රය හා පළාත් සභාවෙන් පරිත්‍යාග ලෙස ලද රු.950,000ක් වටිනා ෂෙඩර් යන්ත්‍රය ද එම භූමිය තුළ උපයෝගීතාවකින් තොරව පැවතිණි.

(ඈ) **තිරසර සංවර්ධන අරමුණු**

තිරසර සංවර්ධන සැලසුම් සකස් කර තිබුණ ද, එම සඳහන් අරමුණු කරා ළඟාවීම සඳහා සැලසුම් කර තිබුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය දුර්වල මට්ටමක පැවතිණි.

3.2 වත්කම් කළමනාකරණය

වත්කම්වල ආරක්ෂාවට කටයුතු නොකිරීම

කොළොන්නා මහජන වැසිකිළිය ඉදිකිරීම සඳහා 1949 වර්ෂයේදී තෑගි ඔප්පුවක් මගින් කොළොන්නා ගම් පත්තුවේ ගම් සභාවට ලබා දී තිබුණු රූඩ් 02ක පමණ භූමිය, එම වැසිකිළිය ගරා වැටීමෙන් පසු 2005 වර්ෂය දක්වා ප්‍රාදේශීය සභාව විසින් කසළ බැහැර කිරීමට යොදාගෙන තිබුණි. පසුව, එය අත්හැර දමා තිබීමෙන් 2023 වර්ෂයේදී කිසියම් පුද්ගලයෙකු විසින් අනවසරයෙන් තම යොදා ගොඩකර අනවසරයෙන් අත්පත් කර ගැනීමට කටයුතු කරමින් සිටින බව වාර්තා වී තිබුණි. එසේවුවත්, එම ඉඩමේ අයිතිය නිරවුල් කර දෙන ලෙස 2023 සැප්තැම්බර් 09 දින ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් ඉල්ලා තිබුණ ද, මේ දක්වා එම කටයුතු අවසන් කර නොතිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

කෝප්පකන්ද එගොඩකන්ද මාර්ගය හා ගල්කන්දගොඩ වම්බටුවත්තයාය මාර්ග සංවර්ධනය කිරීමේ දී කොන්ත්‍රාත් වැඩ සඳහා පිළිවෙලින් රු.690,427ක් හා රු.1,236,015ක් ගෙවා තිබුණ ද, එම කොන්ත්‍රාත් නියමිත ප්‍රමිතියට අනුකූල ද යන්න තත්ත්ව පරීක්ෂණ මගින් තහවුරු කර නොතිබුණි.

CamScanner

4. **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

අයවැය පාලනය

පහත සඳහන් කරුණු හේතුවෙන් වාර්ෂික අයවැය ඵලදායී පාලන කාර්යයක් ලෙස යොදා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

(අ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 23කට අදාළව එකතුව රු.27,326,000ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 18කට අදාළව එකතුව රු.6,096,800ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 51 සිට සියයට 93 දක්වා පරාසයක ඉතිරිවීම් තිබුණි.

ඩබ්.එම්. කුමානායක,

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,

විගණකාධිපති වෙනුවට.